ප්‍රශ්නාර්ථයක් තබා අවසන් වුණ ලෝක කුසලානය

ලෝක කුසලානය ශ්‍රී ලංකාව දෑතටම විත් ගිඳිගි ගියේ ය. කෙසේ වෙතත් බලවතුන් බිම හෙළමින් කඳු දුර්ග තරණය කර සති හයක දුෂ්කර ගමනක යෙදුණ කුමාර සංගක්කාර ඇතුළු ශ්‍රී ලංකා කණ්ඩායම ලෝක කුසලාන අනු ශූරයන් විමද ඉතා විශාල ජයග්‍රහණයක් ලෙස ශ්‍රී ලාංකික ක්‍රීඩා ලෝලීන්ගේ සිත් සතන් පුරවා ලන්තට ප්‍රමාණවත් බව අවිවාදිතය. තරගයකදී ජය හෝ පරාජය සතුටින් බාර ගැනීමට ශ්‍රී ලාංකික ක්‍රීඩා ලෝලීනු අතීතයේ සිටම ලූරුදුව සිටියහ.

මෙම .රරැයේදී ක්‍රීඩා ලෝලීන්ගේ සිත් සතන් තුළ නොමැකෙන මතක සටහන් තැබූ මහේලගේ අගනා ශතකයත් මාලිංග ගේ අති විශිෂ්ට පන්දු යැවීමත් විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

එහෙත් ප්‍රශ්නය එය නොවන්නේ ය. ක්‍රීඩා ලෝලීන්ගේ මනසට විකෘති අදහස් ගලා එන සිදුවීම් මාලාවක් එම තරගය පුරා දක්නට ලැබුණි. තරගය අවසන් වී සතියක් ගෙවී ගිය අදටත් නොයෙකුත් අදහස් සහ තර්ක විතර්ක ඉදිරිපත් කරන ක්‍රීඩා ලෝලීනු බොහෝ ය. සමහර අදහස් වලට කන්දීම පවා අපහසු වක් හා කළකිරීමක් දැනුණද ඒවා කට කතා යයි සිතා අපේ සිත් අපම සනසා ගන්නට අපි කැමැත්තෙමු.

එහෙත් එම තරගයේදී අප දුටු ප්‍රධාන කරුණු කීපයක් සඳහන් කරනු කැමැත්තෙමු.

1 කාසියේ වාසිය උරගා බැලීමේදී කිසිවෙක් නොදුටු හා නොසිතූ අයුරින් දෙවරක් කාසිය උඩ දැමීම.

2 කුමාර සංගක්කාරගේ නොසතුටු මුහුණ හා දුර්වල පන්දු රැකීම හා ක්‍රීඩකයන් දිරි ගැන්වීමටත් කිසිදු උත්සාහයක් නොදැරීම

3 අර්ධ අවසන් පූර්ව තරගයේදී ආබාධ වූ තුන් ඉරියව්වෙන්ම ක්‍රීඩා කරන ඇන්ජලෝ මැතිව්ස් හා පිට දග පන්දු යවන මුරලිදරන් වෙනුවට කණ්ඩායමට නොගැලපෙන ආදේශකයන් යොදා ගැනීම. එනම් මුරලිධරන් ඉවත් නොකරම තරගාවලියේ ක්‍රීඩා නොකළ තවත් පිට දගපන්දු යවන්නකු ඇතුළත් කර තිබීම. (ආබාධිතව දිවීමට නොහැකිව සිටි මුරලිට පන්දුව එල්ල කරමින් ඉන්දියානු ක්‍රීඩකයන් අඩුම තරමින් ලකුණු 15ක් වත් ලබා ගන්නට ඇතැයි මම සිතමි)

4 තරගාවලියේ ඉතා හොඳින්ම පන්දු යැවූ (ඕවරයකට ලකුණු 3ක සාමාන්‍යයක් ලබා දුන්) අජන්ත මෙන්ඩිස් තරගයෙන් ඉවත් කර තැබීම.

5 ඇන්ජලෝ මැතිව්ස් වෙනුවෙන් වේග පන්දු යවන හා ප්‍රහාරාත්මකව පහර දෙන තිසර පෙරේරා යොදවා තිබුණත් තරගයේ ලකුණු වැඩි කර ගැනීමට අවශ්‍ය අවසන් පන්දු වාර වලදී ඔහුට අවස්ථාව අඩු කරමින් ඔහුට පෙර නුවන් කුලසේකර කැඳවීම.

6 කුමාර් සංගක්කාර අවසන් පන්දුවාර කීපයේදී තරගයේ හොඳින් පන්දු යැවූ ක්‍රීඩකයන් ඔවුන්ට පන්දු වාර ඉතිරිව තිබියදීත් නොයෙදවීම.

7 තේරීම් කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන අරවින්ද සිල්වා සෑම තරගයකදීම ක්‍රීඩකයන් සමග එකට සිට තරගය නැරඹුවද මෙතරම් වැදගත් ලෝක කුසලාන අවසන් තරගයකදී ඔහු දකින්නටවත් නොසිටියේ ඇයි?

අවසන් වශයෙන් කුමාර් සංගක්කාර පුන පුනා ඉන්දියානු කණ්ඩායම අගය කළේ ය. ඔවුන් පරාජය කිරීමට නම් ලකුණු 300 ක් 325 ක් අවශ්‍ය බවද පැවසුවේ ය. ඔහු වැනි ප්‍රභල දැන උගත් ක්‍රීඩකයකු පෙර කිසි දිනෙක මෙවැනි කතා පවසනු අපි අසා නැත්තෙමු. ඉතා අන්ත පරාජයකදී පවා ප්‍රභල මානසිකත්වයකින් කණ්ඩායමේ ශක්තිය කියා පෑමට ඔහු නිතර උත්සාහ කළ ක්‍රීඩකයෙකි. ඔහු කොතරම් ඉන්දියානු කණ්ඩායම අගය කළද ඉන්දියානු නායක මහේන්ද්‍ර සිංදෝනි ශ්‍රී ලංකා කණ්ඩායම ගැන හෝ ක්‍රීඩකයකු ගැන වචනයක් වත් සඳහන් නොකිරීමට වග බලා ගත්තේ ය.

මොනතරම් දේ ලිවත් කිව්වත් මෙම තරගය දැන් ඉතිහාසයට එක්වී හමාරය. එම තරගයේදී අප නොදුටු ලොව පුරා කට කතාවට භාජනය වී ඇති අදෘශ්‍යමාන සිදුවීමක් සිදුවී ඇත්නම් එය අපේ අනාගතයකි. ඉදිරියේදීවත් එවන් තත්තවයක් ඇති නොවන්නට වග බලා ගන්නට අප කන්ඩායම ශක්තිය ලැබේවායි ලොව පුරා සිටින ශ්‍රී ලාංකික ක්‍රීඩා ලෝලීන් වෙනුවෙන් ප්‍රාර්ථනා කරමු.

අසෝක සිල්වා

ආරාධනයයි

එළැඹෙන සිංහල හා දමිල අලුත් අවුරුද්ද සමරණු වස් පවත්වන මහා බක් මහ උළෙල 27 වන වරටත් මෙල්බන් පුරවරයේදී පැවැත්වීමට සියලුම කටයුතු සූදානම් කර ඇති බව ඔබ සැමට දන්වනු කැමැත්තෙමු. අවුරුදු අසිරිය විදහා පාන සියලුම තරග ඇතුළුව අනිකුත් විශේෂාංග සෑම වයස් සීමාවකටම සරිලන පරිදි දවස පුරා පවත්වනු ලැබේ.

කැවුම් කොකිස් මුං අලුවා වැනි ශ්‍රී ලාංකික ප්‍රනීත ආහාර ඇතුලත් අති විශාල කෑම මේසයක් සූදානම් කරනු ලබන්නේ අඩුපාඩුවක් නොමැතිව තරග පටන් ගැනීමට පෙරාතුව සියලු දෙනාටම සහභාගි වීමට අවකාශ ලැබෙන පරිදිය.

එපමණක් ද නොවෙයි. එවලේම පිසින ලද දිවා ආහාර තමන්ගේ රුචිය අනුව තෝරාගෙන උනු උනුවේ පහසු මිලට ලබා ගන්නට හැකි වන පරිදි සියලු පහසුකම් සපයා ඇති බවත් කිව යුතුය.

ඒ විතරක්ද? කරදරයකින් තොරව ඔබගේ රථවාහන ගාල් කිරීමේ පහසුකම්ද හදිසි අවස්තාවකදී අවශ්‍ය වුවහොත් ප්‍රථමාධාර හා ගිලන් රථ පහසුකම්ද ඔබගේ ආරක්ෂාව තහවුරු වන පරිදි වික්ටෝරියානු පොලීසියද අපගේ ආරාධනය පරිදි ක්‍රීඩාංගනය තුළ සැදී පැහැදී සිටින බවද දන්වනු කැමැත්තෙමි.

එසේ නම් වික්ටෝරියානු ප්‍රාන්තයේ දස අත විසිර සිටින ශ්‍රී ලාංකික ඔබ සැමට අපත් සමග එක් වී අවුරුදු අසිරිය නොඅඩුව විඳගන්නට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන් නිලධාරීන් හා සංවිධායක කමිටුව වෙනුවෙන් මම ඔබට සාදරයෙන් ආරාධනා කරමි.

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය
ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති
සරත් චන්ද්‍රවංශ

සිඟිත්තන්ට සිංහල අවුරුදු උළෙලක්

රොක්ස්බර්ග්පාක් හා මිල්පාක් සිංහල පාසල් ද්විත්වය සංවිධානය කරනු ලබන සිංහල අවුරුදු උත්සවය 2011 අප්‍රේල් 19 වන දින පව 1 සිට 6 දක්වා තෝමස්ටවුන් ද්විතියික පාසල් බිමේ දී පැවැත්වෙයි.

ඔබේ දරුවනට ශ්‍රී ලාංකීය සංස්කෘතියේ අංග හඳුනාගැනීමටත් අවුරුදු ක්‍රීඩාවනට සහභාගි වී සතුට හා විනෝදය ලබා ගැනීමටත් ත්‍යාග දිනාගැනීමටත් මෙය මහඟු අවස්ථාවක් වනු ඇත.

අලියාට ඇස තැබීම සැඟවුණ අමුත්තා සෙවීම වට්ටක්කා ගෙඩියක ඇට ගණන් කිරීම වැනි ඕනෑම කෙනෙකුට සහභාගි විය හැකි තරග මෙන්ම මෙම පාසල් දෙකේ දරුවන් සහභාගි වන ගෝනි රේස් තොප්පි ඇහිඳීම බනිස් කෑම වැනි තරග රැසකින් මෙම උත්සවය සමන්විත වෙයි. අවුරුදු කුමරා සහ කුමරිය තේරීම විකට ඇඳුම් තරගය වැනි විශේෂාංගද ඊට අයත් ය. මෙම උත්සවය සඳහා ඔබේ දරුවන්ද සමග එක්වන ලෙස සංවිධායක මණ්ඩලය ඉල්ලා සිටියි.